අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/10/01/01/28/152 -II
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2017.12. 29

චක්‍රලේඛ අංක : 48/2017

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් කළමනාකරුවන්,
ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්,

**ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් සඳහා 2017 අයවැය තුළින් යෝජිත දේපළ ණය වරප්‍රසාද ලබා දීම.**

ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කරගෙන රජයේ සේවකයින් වෙත ලබාදෙනු ලබන දේපළ ණය වරප්‍රසාදය, ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුභවතුන් ***(මින් මතු " ගුරුභවතා " යනුවෙන් හඳුන්වනුයේ රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසලක අනුමත පත්වීම්ධාරී ගුරුවරයා වේ)*** අභිප්‍රේරණය කිරීම සඳහා ලබා දීමට 2017 අයවැය මගින් යෝජනා කර ඇත. ඒ අනුව දේපළ ණය යෝජනා ක්‍රමයේ විධිවිධාන පිළිබඳ උපදෙස් ලබාදීම, මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂා කෙරේ.

**02.** දේපළ ණය ලබා දිය හැකි කාර්යයන්

2.1 නිවසක් ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් මිලට ගැනීමට

2.2 ණය ඉල්ලුම්කරුට අයත් ඉඩමක අලුතින් නිවසක් ඉදිකිරීමට

2.3 නිවසක් සහිත ඉඩමක්/ මහල් නිවසක් මිලට ගැනීමට

2.4 ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට සහ අලුතින් කොටසක් එකතු කිරීමට

2.5 අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට

2.6 නිවසක් තැනීමට සුදුසු ඉඩමක් මිලදී ගැනීම හා එහි නිවසක් ඉදිකිරීමට

2.7 ණය ඉල්ලුම්කරුගේ කලත්‍රයාට අයත් ඉඩමක අලුතින් නිවසක් ඉදිකිරීමට/ ඉදිකර ඇති නිවසක් වැඩිදියුණු කිරීමට / අලුතින් කොටසක් එකතු කිරීමට / අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට

2.8 ස්වර්ණභූමි/ජයභූමි දීමනා පත්‍ර යටතේ ලබා දී ඇති ඉඩමක හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ ලබා දී ඇති ඉඩමක නිවසක් ඉදිකිරීමට/ ඉදිකර ඇති නිවස වැඩි දියුණු කිරීමට/ අලුතින් කොටසක් එකතු කිරීමට/ අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට.

## 03. සුදුසුකම්

3.1 මෙම වරප්‍රසාදය සඳහා සුදුසුකම් ලබනුයේ ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ගුරුභවතෙකු වශයෙන් විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබාගෙන, රජයෙන් වැටුප් ආධාර ලබන ගුරුවරුන් පමණි. වැටුප් ආධාර නොලබන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල, අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් ඒ සඳහා සුදුසුකම් නොලබයි.

3.2 පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් හිමි, වර්ෂ 05 ක සේවා කාලයක් සහිත ගුරුභවතෙකු වීම.

3.3 අනුමත ගුරුභවතා හා ඔහුගේ/ඇයගේ කලත්‍රයා අනුමත ගුරුභවතෙකු/රාජ්‍ය නිලධරයෙකු නම් දෙදෙනාම වෙන් වෙන්ව ණය ලබා ගැනීමට සුදුස්සෝ වෙති.

3.3.1 ගුරුභවතාගේ කලත්‍රයා රජයේ නිලධරයෙකු හෝ අනුමත පත්වීම්ලාභී ගුරුභවතෙකු නම් ඔහු/ඇය විසින් රජයේ නිලධරයන්ට දේපළ ණය ලබා දෙන බැංකුවකින් දැනටමත් ලබා ගත් ණය මුදලින් මිලට ගෙන ඇති ඉඩමේ නිවසක් ඉදිකිරීමට/ඉදිකර ඇති නිවසක් වැඩි දියුණු කිරීමට/අලුතින් කොටසක් එකතු කිරීමට/ අර්ධ වශයෙන් ඉදිකර ඇති නිවසක ඉතිරි වැඩ නිම කිරීමට, ණය ලබා නොගත් ගුරුභවතාට එම බැංකුවෙන්ම බද්ධ ගිණුමක් යටතේ ණය ලබා ගත හැකිය.

3.3.2 ගුරුභවතා හා ඔහුගේ/ ඇයගේ කලත්‍රයා අනුමත පත්වීම්ලාභී ගුරුභවතෙකු/රජයේ නිලධරයෙකු වන විට නිවසක් ඉදිකිරීමට/ නිවසක් ඉදිකිරීමට සුදුසු ඉඩමක් මිලදී ගැනීමට හා එහි නිවසක් ඉදිකිරීමට/ නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීමට/ මහල් නිවසක් මිලදී ගැනීමට බද්ධ ගිණුමක් යටතේ දෙදෙනාටම ණය ලබා ගත හැකිය.

3.4 ණය ඉල්ලුම්කරුගේ කලත්‍රයා රජයේ නිලධරයෙකු හෝ අනුමත පත්වීම්ලාභී ගුරුභවතෙකු නොවුවද, කලත්‍රයාට අයත් ඉඩමක නිවසක් ඉදිකිරීම සඳහා බද්ධ ගිණුමක් යටතේ ණය ලබා ගත හැකිය.

## 04. ණය අයකර ගැනීමේ කාල සීමාව

උපරිම කාලය වර්ෂ 25 ක් හෝ ගුරුභවතාට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හෝ යන දෙකෙන් පළමුව එළඹෙන කාලය තුළ සම්පූර්ණ ණය මුදල පියවා ගත හැකි අයුරින් ආපසු අය කර ගැනීමේ කාල සීමාව තීරණය කළ යුතුය.

## 05. ණය ප්‍රමාණය

5.1 ගුරුභවතාට හිමිකම ලබාගත හැකි උපරිම ණය මුදල එම ගුරුභවතාගේ දීමනා හැර වසර 7 ක ඒකාබද්ධ වැටුප හෝ රුපියල් ලක්ෂ 30 ක මුදල යන දෙකෙන් අඩු මුදල වේ.

5.2 ඉල්ලුම්කරු හා කලත්‍රයා යන දෙදෙනාම මෙම ණය ඉල්ලුම් කිරීමේ හිමිකම ලබන අවස්ථාවල ඉහත 5.1 ට අනුකූල වන පරිදී ලබාගත හැකි උපරිම ණය සීමාව ලක්ෂ 60 කි.

5.3 රජයේ වගකීමකින් තොරව යම්කිසි ගුරුභවතෙකුට ඉහත 5.1 සීමාවට අමතරව ණය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, බැංකුවේ සාමාන්‍ය කොන්දේසිවලට යටත්ව ණය ලබා ගැනීමට බැංකුව සමග ගිවිස ගත හැක.

5.4 ගුරුභවතෙකු විසින් දැනටමත් ණය ඉල්ලුම් කරන ලදුව ණය මුදල බැංකුවේ පොරොත්තු ලේඛනගතව ඇති කාලසීමාවේදී සිදුවන වැටුප් වැඩිවීම පදනම් කරගෙන, ඉල්ලා ඇති ණය මුදල වැඩිකිරීමට ඉඩ නොදිය යුතුය.

## 06. පොළිය

6.1 ඉහත 5.1 වගන්තිය යටතේ ලබා ගන්නා ණය මුදල් වෙනුවෙන් පහත වගුවේ සඳහන් පරිදි වාර්ෂික පොළියක් අය කරනු ලැබේ.

| ණය මුදල | ගුරුභවතා විසින් ගෙවිය යුතු | රජය විසින් ගෙවිය යුතු | බැංකුවට ගෙවිය යුතු පොළී ප්‍රතිශතය |
|---|---|---|---|
| රු. 500,000/- දක්වා | 4% | 8% | 12% |
| රු. 500,001/- සිට රු. 1,000,000/- දක්වා | 8% | 4% | 12% |
| රු. 1,000,001/- සිට රු. 3,000,000/- දක්වා | 11% | 3% | 14% |

6.2 පොළිය ගණනය කරනු ලබන්නේ හීන වන ණය ශේෂය පදනම් කර ගනිමිනි.

6.3 ගුරුභවතාගෙන් අය කර ගනු ලබන ණය වාරිකය හා ඉහත 6.2 අනුව ගණනය කරන ලද 6.1 හි සඳහන් පොළී ප්‍රතිශතය අනුව සකස් කරන ලද පොළිය ඇතුළත් මාසික වාරිකය, මුළු ණය මුදල ගෙවා අවසන් වන තෙක් සමාන වාරික ලෙස අය කළ යුතුය.

## 07. ඇප

ඉහත අංක 02 හි සඳහන් කාර්යයන් වෙනුවෙන් ණය අයදුම් කරන දේපළ, බැංකුව වෙත උකස් කළ යුතුය.

## 08. ණය වාරික අය කිරීම හා ප්‍රේෂණය කිරීම.

8.1 ගුරුභවතා සේවය කරන පාසල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් බැංකුවේ නිර්දේශිත ණය වාරික මුදල, ගුරුවරයාගේ වැටුපෙන් අඩු කරනු ලබන පොළිය හා රජය විසින් දරන පොළිය අදාළ බැංකුව වෙත මාසිකව ප්‍රේෂණය කළ යුතුය.

8.2 ගුරුභවතා වෙනුවෙන් රජය විසින් දරනු ලබන පොළී ප්‍රමාණය රජයේ වියදමක් ලෙස භාණ්ඩාගාරයේ උපදෙස් මත ගිණුම් තැබිය යුතුය.

## 09. හිඟ ණය වාරික.

9.1 කිසියම් හේතුවක් නිසා ගුරුභවතාට වැටුප් නොගෙවන අවස්ථාවකදී ණය වාරික අය නොකිරීම පිළිබඳව අදාළ බැංකුව වෙත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නොපමාව දැනුම් දිය යුතුය.

9.2 සේවයෙන් ඉවත්වීමකදී/සේවය අතහැර යාමකදී/ සේවයෙන් පහකිරීමකදී/සේවය අවසන් කිරීමකදී ණය ශේෂය සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

9.3 වැඩ තහනම් කිරීමකදී/ සේවයෙන් පහ කිරීමකදී/ සේවය අතහැර යාමකදී/ සේවය අවසන් කිරීමකදී/සේවයෙන් විශ්‍රාම යැමේදී ණය වාරික අදාළ ණය ඉල්ලුම්කරු විසින් බැංකුවේ නීති හා

රෙගුලාසිවලට අනුකූලව රජය විසින් දරන පොලියේ වෙනසද ඇතුළුව පෞද්ගලිකව අදාළ බැංකුව වෙත ගෙවිය යුතුය.

9.4 වැඩ තහනම් කළ ගුරුභවතෙකු නැවත සේවයේ පිහිටුවහොත් වැඩ තහනම් කරන ලද කාලය තුළ ගුරුභවතා විසින් ගෙවන ලද ණය වාරිකවලට අදාළව රජය විසින් දරන පොළිය පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

9.4.1 ගුරුභවතාගේ වරදක් නොමැති බව දක්වමින් ඔහු/ඇය නැවත සේවයේ පිහිටුවහොත් ඔහු/ඇය විසින් ගෙවන ලද ණය වාරිකවල ඇතුළත්, රජය විසින් දරනු ලබන පොළිය සම්පූර්ණයෙන් ඔහු වෙත ප්‍රතිපූර්ණය කළ යුතු වේ.

9.4.2 ගුරුභවතා නැවත සේවයේ පිහිටුවන ලද්දේ යම් කිසි දඬුවමකට යටත්ව නම් දඬුවමේ ස්වභාවය නොසලකා ගෙවන ලද වාරිකවල ඇතුළත් රජය විසින් දරනු ලබන පොළි ප්‍රමාණයෙන් අඩක් පමණක් ප්‍රතිපූර්ණය කළ යුතු වේ.

9.4.3 යම්කිසි ගුරුභවතෙකුට අඩ වැටුප් ගෙවන අවස්ථාවලදී ණය වාරික හා පොළිය අය කිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

9.4.4 එසේ වුවත් රජයේ අනුමත පත්වීම්ධාරී පෞද්ගලික පාසල් ගුරුවරියක ප්‍රසූත නිවාඩු මත අර්ධ වැටුප් ලබන අවස්ථාවකදී ණය වාරිකය හා පොළිය පෞද්ගලිකව බැංකුව වෙත ගෙවිය යුතු අතර, පොළියේ වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

9.4.5 ගුරුභවතෙකු වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී ණය වාරික හා පොළිය අයකිරීම සම්බන්ධව බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතුය.

9.4.6 සේවා කාලය තුළදී ගුරුභවතෙකු මිය ගියේ නම් හෝ පූර්ණ අකර්මන්‍යතාවයකට පත්වූයේ නම් හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද්දේ නම්, එදිනට ඇති ණය ශේෂය අයකර ගැනීම සඳහා බැංකුව සමග රක්ෂණාවරණයක් ඇති කර ගත යුතුය.

9.4.7 යම් කිසි හේතුවක් නිසා ගුරුභවතෙකු සිය දිවි හානිකරගෙන ඇත්නම් අදාළ ණය මුදල් අය කර ගැනීම සම්බන්ධව බැංකුවේ නීතිරීති අනුගමනය කළ යුතුය.

## 10. ණය ඉල්ලුම්පත් පෙරසැරි කිරීමේ ගාස්තු.

10.1 නිර්දේශිත බැංකුවකින් ණය ලබා ගැනීමට යාමේදී ඉදිරිපත් කළ යුතු ලියකියවිලි වන තක්සේරු වාර්තාව, නීතිඥ ගාස්තු හා ගමන් වියදම් වෙනුවෙන් රු. 7500/- ක් හෝ ණය මුදලින් 1% ක් යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතුය.

10.2 ඉහත අංක 10.1 වගන්තියේ සඳහන් ගුරුභවතා ගෙවිය යුතු අවම මුදල ඔහුගේ/ඇයගේ මනාපය අනුව මුදලින් ගෙවීමට හෝ ණය මුදල වෙනුවෙන් ගෙවනු ලබන පළමු වාරිකයෙන් අඩු කිරීමට හෝ ණය මුදලේ මාසික වාරික මුදලට ඇතුළත් කොට හෝ අය කර ගැනීමට කටයුතු කළ හැකිය.

10.3 ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් පත්ඉරු ලබා ගැනීම, හිමිකම් වාර්තාව ලබා ගැනීම, මැනුම් සැලසුම් ගාස්තු හා හිමිකම් ඔප්පුවල දෝෂ ඇත්නම් ඒවා රක්ෂණය කිරීම සඳහා යන වියදම් ණය මුදලට එකතු කර මාසික වාරිකය තීරණය කළ යුතුය. හිමිකම් ඔප්පුවල දෝෂ ඇත්නම් එය රක්ෂණය කිරීම අනිවාර්ය වේ.

## 11. දේපළ ණය දීමේ සාමාන්‍ය කොන්දේසි.

11.1 මෙම දේපළ ණය ලබා ගත හැක්කේ සේවා කාලය තුළ එක් වරක් පමණි. එසේම එක් දේපළක් සඳහා පමණි.

11.2 ඉහත 9.4.6 හි දක්වා ඇති රක්ෂණාවරණයක් ලබා ගැනීම ණය ඉල්ලුම්කරුගේ වගකීමක් වේ.

11.3 ණය මුදල නිර්දේශ කිරීමේදී නොසැලකිලිමත්කම හේතුවෙන් ඇතිවන ගැටළුවලදී සහ රජයට සිදුවන අලාභයන්හීදී ණය මුදල නිර්දේශ කළ නිලධරයාට විරුද්ධව කටයුතු කිරීමට පියවර ගන්නා අතර, අලාභය එම නිලධරයාගෙන් අය කරනු ඇත.

11.4 රජය විසින් දරණ පොළිය මත පෞද්ගලික පාසල් ගුරුභවතාට ලබා දිය යුතු ණය මුදල තීරණය කිරීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

11.4.1 මෙම ණය මුදල ගුරුභවතෙකුගේ වැටුපෙන් අවකරණය කළ හැකි උපරිම සීමාව වූ 40% සීමාවෙන් නිදහස් වේ.

11.4.2 ගුරුභවතාගේ වැටුපෙන් අවකරණය කරන ලද බැඳීම්ගත අඩුකිරීම් හා වෙනත් අඩුකිරීම් සැලකිල්ලට ගෙන 11.4.1 වගන්තියට යටත්ව බැංකුව වෙත උපරිම ණය මුදල නිර්දේශ කළ යුතුය.

11.4.3 බැංකු උපරිම ණය මුදල අනුමත කිරීමේදී ගුරුභවතාගේ දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා ගුරුභවතාගෙන් අය කරනු ලබන පොළිය යන කොටස් දෙකම අඩු කිරීමට හැකි වන ආකාරයට තීරණය කළ යුතු වේ.

11.5 යම් කිසි ගුරුවරයෙකු ණය ලබා ගන්නා විට සේවය කළ පාසලින් ඉල්ලා අස්වුවහොත්, බැංකුවේ සාමාන්‍ය නීති රීති අනුගමනය කළ යුතු වේ. අධ්‍යාපන අමාත්‍යාංශය අදාළ ගුරුභවතාගේ දේපළ ණය පොළිය ගෙවීම පිළිබඳව වගකීම දරනුයේ ඔවුන් ණය ලබා ගත් පාසලේම අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු වශයෙන් සේවයේ යෙදී සිටින තුරු පමණි.

11.6 ණය ලබා දීමට බැංකුව වෙත නිර්දේශයක් ලද ගුරුභවතෙකු එම ණය මුදල ලබා ගැනීමට පෙර වැඩ තහනමකට ලක්වුවහොත් හෝ සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ අනිවාර්ය නිවාඩු යවනු ලැබුවහොත්, එවැනි තත්ත්වයන් බැංකුවෙන් ණය මුදල ලබා දීමට පෙර බැංකුව වෙත නොපමාව වාර්තා කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ. එබැවින් එවන් තත්ත්වයන් උද්ගත වුවහොත්, වහාම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ලිඛිතව දැනුවත් කිරීමට අදාළ පාසලේ කළමනාකරු වග බලා ගත යුතු වේ.

11.7 ණය ලබා ගැනීමට සුදුසුකම් ලත් ගුරුභවතෙකුට කලාප අධ්‍යාපන කාර්යාලයෙන් බැංකුව වෙත කරනු ලබන නිර්දේශය ප්‍රමාද වන්නේ නම් හෝ බැංකුවකින් ණය ලබා ගැනීමට අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවන්නේ නම්, ඒ බව ලිඛිතව භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

## 12. ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම හා නිර්දේශ කිරීමේ ක්‍රියා පරිපාටිය.

12.1 ණය ඉල්ලුම්කරුවකු විසින් ඇමුණුම 01 අනුව අයදුම් පත්‍රය පිටපත් 2කින් පිළියෙළ කර ණය ලබා ගැනීමට 12.6 හි සඳහන් බැංකුවලින් නිකුත් කරන ලද සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය සමග ඇමුණුම 03 අනුව අදාළ ලියවිලි කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය

12.2 කලාප අධ්‍යාපන කාර්යාලය විසින් අදාළ ණය ඉල්ලුම් පත්‍රය ලේඛනයකට ඇතුළත් කර, 5.1 වගන්තිය අනුව ලබාදිය හැකි ණය මුදල තීරණය කොට ණය ඉල්ලුම්කරුගේ කැමැත්ත ලබා දී ඇති බැංකුව වෙත සතියක් ඇතුළත නිර්දේශිත ණය ඉල්ලුම් පත්‍රය යොමු කිරීමට කටයුතු කළ යුතුය.

12.3 ණය ඉල්ලුම්කරු විසින් අදාළ ණය මුදල ලබා ගැනීම සඳහා එම බැංකුවේ නීතිරීතිවලට එකඟව හා චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව අවශ්‍ය තොරතුරු මාස තුනක් සම්පූර්ණ වීමට පෙර බැංකුව

වෙත සපයා ණය මුදල අනුමත කිරීමෙන් අනතුරුව බැංකුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කළ යුතුය.

12.4 බැංකු විසින් ණය මුදල නිදහස් කිරීමෙන් පසු ඒ බව ඇමුණුම 02 අනුව අධ්‍යාපන අමාත්‍යාංශයට හා අදාල කලාප අධ්‍යාපන කාර්යාලයට දැනුම් දිය යුතු වේ. තවද මාසිකව පොලී අයකිරීම පිළිබඳ වාර්තාවක් බැංකුව විසින් කලාප අධ්‍යාපන කාර්යාලයට එවිය යුතුය.

12.5 කලාප අධ්‍යාපන කාර්යාලය විසින් බැංකුවක් වෙත නිර්දේශ කරන ලද ණය ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් බැංකුවට අවශ්‍ය වන අවස්ථාවකදී ගුරුභවතා විසින් එම පැහැදිලි කිරීම් බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම පැහැදිලි කිරීම් මාස 3ක් ඇතුළත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එවැනි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. කිසිදු හේතුවකින් මෙම කාලය දීර්ඝ කිරීමක් සිදු නොකරනු ලබන අතර එවැනි ඉල්ලීම් නව ඉල්ලීමක් ලෙස පොරොත්තු ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

12.6 මෙහි පහත සඳහන් කර ඇති බැංකුවලින් පමණක් ණය ලබා ගත හැක.

- ❖ මහජන බැංකුව
- ❖ ලංකා බැංකුව
- ❖ ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- ❖ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

13. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරනු ලබන අතර, ඊට අදාළ විධිවිධාන 2017. 12. 29 දින සිට ක්‍රියාත්මක කෙරේ

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම් | - | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය |
| 2. | ලේකම් | - | මුදල් අමාත්‍යාංශය |
| 3. | ලේකම් | - | මහා භාණ්ඩාගාරය |
| 4. | ලේකම් | - | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 5. | අධ්‍යක්ෂ ජනරාල් | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| 6. | අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) | - | අධ්‍යාපන අමාත්‍යාංශය |

ඇමුණුම 01

රජයේ අනුමත පත්වීම්ධාරී පෞද්ගලික පාසල් ගුරුභවතෙකු

**ණය ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රය.**

01.

i) මුලකුරු සමග නම:.......................................................................................

.......................................................................................මහතා/මහත්මිය/මෙනවිය

ii) මුලකුරුවලින් කියවෙන නම් :.......................................................................

.................................................................................................................

iii) ස්ථිර ලිපිනය:..............................................................................................

iv) දුරකථන අංක (නිවස) ...................(ජංගම ):..................(රාජකාරී) :....................

v) විවාහක/අවිවාහක බව :....................................................................................

vi) උපන් දිනය හා ස්ථානය :.................................................................................

vii) ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................................

viii) රාජකාරී ස්ථානය:.........................................................................................

ix) තනතුර :.......................................................................................................

x) රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු ලෙස සේවා කාලය :...................................

02.

i) කලත්‍රයාගේ සම්පූර්ණ නම :...............................................................................

.................................................................................................................

ii) උපන් දිනය හා ස්ථානය :...................................................................................

iii ) ජාතික හැඳුන්ම්පත් අංකය :...............................................................................

iv) දුරකථන අංක (ජංගම ):.......................... (රාජකාරී) :.................................

v) රාජකාරී ස්ථානය:............................................................................................

vi) රාජකාරී ලිපිනය:...........................................................................................

vii) තනතුර :.......................................................................................................

viii) තනතුරේ සේවා කාලය : ...................................................................................

03. යැපෙන්නන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ වයස් : ........................................................

.................................................................................................................

.................................................................................................................

04. ණය අයදුම් කරන කාර්යය : (47/2017 චක්‍රලේඛයේ 03 වගන්තිය අනුව).........................................................................................................

..............................................................................................................................................

05. ණය මුදලේ ප්‍රමාණය : රු. .......................................ආපසු ගෙවන කාලය :......................

06. ණය මුදලේ සුරක්ෂිතතාව වෙනුවෙන් ඉදිරිපත් කරන දේපලේ නීතිමය විස්තර

i. වරිපනම් අංකය :....................................................

ii. භූමියේ ප්‍රමාණය :...................................................

iii. වීදිය හා නගරය :.....................................................

iv. අයිතිකරු : ......................................................................................................................................

v. මිලදී ගත් වටිනාකම :.......................................

vi. ඉදිකිරීම් වියදම : රු. .......................................

vii. සැලසුම් අංකය :.....................ලොට් අංකය :..................... සැලසුම සකස් කළ දිනය : ..............................

viii. මිනින්දෝරුතැනගේ නම : ...........................................................................................................

ix. ඉඩම බැඳීමකට යටත් නම් ඒ පිළිබඳ විස්තර :.............................................................................

07. මාසික ආදායම :

i. අයදුම්කරුගේ සම්පූර්ණ වැටුප : රු. ...................................

ii. කලත්‍රයාගේ සම්පූර්ණ වැටුප : රු. ......................................

iii. වෙනත් ආදායම් ( සඳහන් කරන්න) : රු. ............................

iv. මුළු ආදායම : රු ..............................

08. බැංකු ගිණුම් :

| බැංකුවේ නම | බැංකු ශාඛාව | ගිණුම් අංකය | ගිණුමේ වර්ගය |
|---|---|---|---|
| ___________ | ___________ | ___________ | ____________ |
| ___________ | ___________ | ___________ | ____________ |

09. පවතින බැඳීම් ණයකරුවෙකු/ඇපකරුවෙකු ලෙස

| බැංකුව | මුල් ණය මුදල ණය මුදල | දැනට පවතින කරන ලද | ඉදිරිපත් හේතුව සුරැකුම | ණය ලබාදුන් |
|---|---|---|---|---|
| ----------- | රු. ------------- | රු. ------------- | ------------ | ------------ |
| ----------- | රු. ------------- | රු. ------------- | ------------ | ------------ |

10. ඇමුණුම 03 අනුව ණය අයදුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතු ලියකියවිලි (මුල් පිටපත්)මේ සමග ඉදිරිපත් කරමි.

**මිලදී ගැනීමක් නම් :** විකිණීම පිළිබඳ එකඟතාව, මිලට ගන්නා දේපළට අදාළ ඔප්පුවේ පිටපත සහ අනුමත ගොඩනැගිල්ලේ සැලැස්ම, විකුණුම්කරු විකිණීමට කැමැත්ත ප්‍රකාශිත ලිපිය (ඇමුණුම 04 අනුව)

11. අයදුම්කරු පාලනය වන නීතිය : සාමාන්‍ය නීතිය/උඩරට නීතිය/තේසවලාමේ නීතිය/ මුස්ලිම් නීතිය

දේපළ ණය ලබා ගැනීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 48/2017 හි විධිවිධානයන්ට හා බැංකුව විසින් අනුගමනය කරනු ලබන නීතිරීතිවලට යටත්ව දේපළ ණය මුදල ලබා ගැනීමට එකඟ වෙමි.

-----------------------------

අයදුම්කරුගේ අත්සන

දිනය : ..............................

---

12. ආධාර ලබන පෞද්ගලික පාසලක් වන .................................................................... විදුහලේ අනුමත පත්වීම්ධාරී ගුරුවරයෙකු ලෙස සේවය කරන.................................................................... ස්වාමීන් වහන්සේ/ පියතුමා/කන්‍යාසොයුරිය/මහතා/මහත්මිය/මෙනවිය ට රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුභවතුන් සඳහා රජය විසින් ලබා දෙන ආපදා ණය ප්‍රතිලාභය ලබාදීම නිර්දේශ කරමි.

.........................................  ............................

දිනය  විදුහල්පතිගේ අත්සන හා නිලමුද්‍රාව

...............................................  ...............................................

දිනය  පාසල් කළමනාකරුගේ අත්සන හා නිලමුද්‍රාව

---

13. **.......................................................................(කලාප අධ්‍යාපන කාර්යාලයේ) ආයතන ශාඛාව විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. මුල් පත්වීම් දිනය : ..............................................................................................
2. උපන් දිනය : ..............................................................................................
3. ණය ඉල්ලුම් කරන දිනට වයස : ........................................................................
4. (අ) රජයේ ආධාර ලබන රජයේ අනුමත පෞද්ගලික පාසලක අනුමත ගුරු පත්වීමක්ද ?

   (ආ) එසේ නම් කවර දිනක සිට ද ?
5. රජයෙන් ලබාගෙන ඇති, ගෙවීමට ශේෂව තිබෙන ණය පිළිබඳ විස්තර :

| ණය වර්ගය | ....................දිනට ගෙවිය යුතු ණය ශේෂය |
|---|---|
| | |

6. මාසික වැටුප් විස්තරය :

i. මාසික ඒකාබද්ධ වැටුප : රු. ............................................
ii. දීමනා : රු.......................................................................
iii. මුළු වැටුප : රු. ................................................................
iv. මුළු අඩු කිරීම් (බැදීම්ගත අඩු කිරීම් සහිතව) : රු. .....................................
v. ශුද්ධ වැටුප : රු. ..............................
(අදාළ මාසයේ වැටුප් විස්තරය අමුණා ඇත)
vi. අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 48/2017 හි 5.1 වගන්තියේ විධිවිධාන පරිදි නිලධරයාට ලබා දිය හැකි උපරිම ණය මුදල දීමනා හැර මාසික ශුද්ධ වැටුපෙන් ණය මුදලේ වාරිකය හා සේවකයාගෙන් අය කරනු ලබන පොළිය යන කොටස් දෙකම අඩු කිරීමට හැකිවන ආකාරයට තීරණය කළ යුතුය :
(ඉලක්කමෙන් ..........................)
(අකුරෙන් .................................)

7. ගුරුභවතාට විරුද්ධව නොවිසඳුන විෂමාචාර චෝදනාවක් හෝ දැනට විභාග වෙමින් පවතින විෂමාචාර චෝදනා තිබේ නම් ඒ පිළිබඳ විස්තර : ..................................................

------------------------------------
මාණ්ඩලික නිලධරයා
(ආයතන)

දිනය :...............................

<u>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :</u>

මගේ අංකය : ..............................................
කලාප අධ්‍යාපන කාර්යාලය : ..............................................

බැංකු කළමනාකරු
.......................................බැංකුව
.......................................ශාඛාව

රජය විසින් ලබා දෙන පොළී සහනාධාර මත......................................මහතාට/මහත්මිය/මෙනෙවියට, ඔහුගේ/ඇයගේ ඉල්ලීම පරිදි ................................(කාර්යය) සඳහා මාසික වැටුපෙන් අය කර ගත හැකි මුදල අනුව පිරිනැමිය හැකි උපරිම ණය මුදල රු. .............................. බව නිර්දේශ කරමි.

එසේම ඔහුගේ/ ඇයගේ වැටුපෙන් බැංකුවේ නිර්දේශ අනුව බැංකුව විසින් ගණනය කරනු ලබන ණය වාරිකය හා පොළිය ද සහිත නිලධරයාගෙන් අය කළ යුතු මාසික ණය වාරිකය හා එම මාසික ණය වාරිකයට ඇතුළත් වන රජය විසින් දරනු ලබන පොළී ප්‍රමාණය ණය වාරිකය 8.1 වගන්තිය යටතේ මාසිකව බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට එකඟ වෙමි.

අත්සන :.......................................
නම :..............................................
තනතුර :.......................................
(නිල මුද්‍රාව)

ඇමුණුම 02

බැංකුව විසින් ණය මුදල නිදහස් කළ බව අදාළ
කලාප අධ්‍යාපන කාර්යාලයට දැන්විය යුතු ආකාරය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
..............................කලාප අධ්‍යාපන කාර්යාලය
<u>..................................................................ගේ ණය මුදල නිදහස් කිරීම.</u>

1. බැංකුව හා බැංකු ශාඛාවේ නම :

2. ණය හිමිකම් අංකය :

3. ණයලාභියාගේ සම්පූර්ණ නම :

4. (අ) ණයලාභියා දැනට දරණ තනතුර :

(ආ) ණයලාභියා අයත් සේවාව :

5. ලිපිනය පෞද්ගලික :

රාජකාරී :

6. අනුමත කරන ලද ණය මුදල : රු. ..................................(ඉලක්කමෙන්)

: රු....................................(අකුරෙන්)

7. ණය මුදල අනුමත කළ දිනය :

8. ණය අය කරනු ලබන කාල සීමාව :

වර්ෂය 20.................සිට 20 ...................... දක්වා

9. මාසික ණය වාරිකය

9.1 පොළිය සමග වාරිකයේ වටිනාකම : රු. ...............................

9.2 ගෙවිය යුතු මුළු වාරික ගණන : ...................................

දිනය :..............................

.........................................
බැංකු කළමනාකරුගේ අත්සන

නම :..................................
නිල මුද්‍රාව : ......................

පිටපත් : අධ්‍යාපන අමාත්‍යාංශය
..........................................(ණයකරු)

ඇමුණුම 03

**ණය අයදුම්පත්‍රය සමග බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ලියකියවිලි**

1. ජාතික හැඳුනුම්පත (මුල් පිටපත අනුව සහතික කරන ලද ඡායා පිටපත් දෙකක්)

2. අවසාන වැටුප් විස්තරය (සේවා යෝජකයා විසින් සහතික කරන ලද)

3. අනුමත මිනින්දෝරු සැලැස්ම (මුල් පිටපත)

4. හිමිකම් ඔප්පුව (ඡායා පිටපතක්) - හිමිකම් ඔප්පුවේ මුල් පිටපත ණය ලබා ගැනීමේදී බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

5. වසර 30 කට අදාළ ලුහුඬු සටහන් ( ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත් පත්‍රිකා)

6. හිමිකම් වාර්තාව

7. පළාත් පාලන ආයතනයෙන් ලබා ගත යුතු ලියකියවිලි

- දේපළ හිමිකම් සහතිකය
- පවරා නොගැනීමේ සහතිකය
- වීථි රේඛා හා ගොඩනැගිලි සහතිකය
- තක්සේරු නිවේදනය හා අවසාන කාර්තුවට වරිපනම් බදු ගෙවූ රිසිට්පත

8. දේපළට පිවිසීමේ මාර්ග සටහන

9. අනුමත ගොඩනැගිලි සැලසුම

10. මිලට ගැනීමක් විකුණුම්කරුගේ ලිපිය (ඇමුණුම 04 අනුව) හා විකුණුම්කරුගේ ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි නීත්‍යානුකූල හැඳුනුම්පතක්(උදා : රියදුරු බලපත්‍රය හෝ කල් ඉකුත් නොවූ ගමන් බලපත්‍රය) හා මුල් පිටපත අනුව සහතික කරන ලද ඡායා පිටපතක්

**සැ. යු.**
**ඉල්ලුම් කරනු ලබන ණය මුදලේ සම්බන්ධතාව අනුව අදාළ වන ලියවිලි පමණක් ඉදිරිපත් කිරිම ප්‍රමාණවත්ය.**

ඇමුණුම 04

දේපළ හිමිකරු දේපළ විකිණීමට එකඟතාව
ප්‍රකාශ කළ යුතු ආකාරය

.........................................
.........................................
.........................................
(විකුණුම්කරුගේ ලිපිනය)

.....................................
..................................... බැංකුව
කොළඹ.

**දේපළ විකිණීමට එකඟතාව ප්‍රකාශ කිරීම**

ඉහත ලිපිනයේ පදිංචි ..........................................................වන මට/අපට අයත් ............................මහ
(විකුණුම්කරුගේ සම්පූර්ණ නම)
නගර සභා/නගර සභා/ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත විස්තර සඳහන් බිම් කොටස/නිවස සහිත දේපළ ............................................................ ලිපිනයේ පදිංචි..........................................................
(ගැනුම්කරුගේ ලිපිනය ) (ගැනුම්කරුගේ සම්පූර්ණ නම)
..................................................................යන අයට විකිණීමට කැමැත්ත ප්‍රකාශ කරමි/ කරමු.
(ජාතික හැඳුනුම්පත් අංකය හා දිනය)

1. ඔප්පු අංකය / නඩු තීන්දු අංකය :...................................දිනය:............................................
සහතික කළ නොතාරිස්තැනගේ නම :.....................................................................................

2. පිඹුරුපත සැකසූ බලයලත් මිනින්දෝරුතැනගේ නම :........................................................
පිඹුරුපත සකස් කර ඇති දිනය :..............................
කැබලි අංකය : .....................ප්‍රමාණය අක්කර :..............රූඩ :................ පර්:.............

3. ඉහත විස්තර සඳහන් දේපළ මුදලින් රුපියල් : .......................................... (රු....................)
විකිණීමට එකඟතාව ප්‍රකාශ කරමි. (අකුරින් ලියන්න) (ඉලක්කමින්)

මෙම දේපළ විකිණීම වෙනුවෙන් අත්තිකාරම් මුදල වශයෙන් රු. ......................ක් දැනටමත් මා/ අප විසින් ලබාගෙන ඇති බව පිළිගන්නා අතර, ඔබ ආයතනයෙන් අනුමත ණය මුදලත්, විකිණීමට ගිවිසගෙන ඇති ණය මුදලත් අතර වෙනසක් වේ නම් එම මුදල ඔප්පු අත්සන් කරන අවස්ථාවේදී ගැනුම්කරුගෙන් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමි /කරමු. ඔබ ආයතනයෙන් මා/ අප වෙත ලැබෙන මුදල් මාගේ/ අපගේ පහත සඳහන් බැංකු ගිණුමෙහි බැරට ගෙවන මෙන් ඉල්ලමි/ ඉල්ලමු.

4. බැංකු ගිණුමෙහි සඳහන් නම :.........................................................................................
බැංකුව / ශාඛාව : ..................................................
ගිණුම් අංකය : ..................................................
(ඇටෝර්නි බලකරු සිටින අවස්ථාවලදී ඇටෝර්නි බලකරුගේ බැංකු ගිණුම් විස්තර නොව විකුණුම්කරුගේ බැංකු ගිණුම් විස්තරය ඇතුළත් කළ යුතුය)

5. විකුණුම්කරුගේ ආදර්ශ අත්සන සහතික කරන අය පහත සඳහන් කෙනෙකු විය යුතුය.

i. අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී
ii. අධිකරණ බල ප්‍රදේශය තුළ නීතිඥයෙකු
iii. පූජනීය ස්ථානයක ප්‍රධාන පූජකතුමා
iv. සිවිල් ලැයිස්තුවේ නම සඳහන් නිලධරයෙකු

................................................
විකුණුම්කරුගේ/කරුවන්ගේ ආදර්ශ අත්සන
ජාතික හැඳුනුම්පත් අංක හා දින
01............................................
02............................................

අත්සන සහතික කරන ලද අයගේ

නම :..................................................
තනතුර ....................................................
ලිපිනය ....................................................
අත්සන ..............................
දිනය .........................
ජාතික හැඳුනම්පත් අංකය............................